කවරයේ කතාව

# කුඩා තේ වතු හිමියන්ගේ සංගමය

**සමූහයා ගේ පැවැත්ම උදෙසා සන්ධානගතවීම සෑම ක්ෂේත්‍රයකම පාහේ දක්නට ලැබෙන්නකි. කුඩා තේ වතු හිමියන් ද එලෙස සන්ධානගත කුඩා තේ වතු හිමියන්ගේ සංගමය පිහිටුවා ඇත. ගාල්ල, මාතර, කෑගල්ල, රත්නපුර, නුවර, නුවරඑළිය, බදුල්ල, හම්බන්තොට ආදී දිස්ත්‍රික්කයන්හි ග්‍රාමීය මට්ටමේ සංවිධාන 1270 ක් මෙයට අයත් ය.**

සාමාජිකයන් ගේ ආර්ථික සුරක්ෂිතතාව නිෂ්පාදන අතර මැදියන්ගෙන් සූරා කෑම වැළැක්වීම සහ කේවල් කිරීමේ ශක්තිය ලබා දීම ප්‍රමුඛව, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා එක්ව වගා සහනාධාර ක්‍රමවත්ව සාමාජිකයන් අතරේ බෙදා හැරීම ද මෙම සංගමයේ ප්‍රධාන කාර්යභාරයන් ය.

1989 වර්ෂයේ සිට ක්‍රියාකාරී සංගමයක් වූ මෙය, තම සංගමයේ සාමාජිකයන් ගේ වතු යටිතල කටයුතු සේ ම, නිෂ්පාදන ක්‍රියාවලිය නිමවන තුරු ම බිම් සකස් කිරීම, දළු එකතු කිරීම තේ කොළ නිෂ්පාදන ප්‍රවාහනය, පොහොර බෙදා දීම ආදී වශයෙන් සහයෝගය දක්වයි. එවක, වැවිලි කර්මාන්ත ඇමති, රත්නසිරි වික්‍රමනායක මැතිතුමාගේ සහ අමාත්‍යාංශ සභාපති රෝහණ ඉලංගරත්න මහතාගේ මූලිකත්වයෙන්, සුබසාධන සංගමයක් ලෙස ඇරඹි, සමස්ත ලංකා කුඩා තේ වතු හිමියන්ගේ සංගමය 1990 දසකයේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාජිකත්වය හිමි කර ගත්තේය. වර්ෂ 1997 දී, ඔවුන් ගේ ප්‍රගතියේ මුල් පියවර තබමින් තේ ශක්ති අරමුදල පිහිටුවා ගන්නා ලදී.

සාමාජික දායක මුදලින් ඇරඹි තේ ශක්තිය, එම මුදල් ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීමෙන් හා භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙන්, මූල්‍ය සංචිතය තර කර ගැනීමත් සමග සාමාජිකයන්ට වැඩි වශයෙන් සහන සැලසීමට හැකි වී තිබේ.

තේ ශක්ති අරමුදල සතුව කර්මාන්තශාලා 13 කි. එමගින් නියමිත බර ප්‍රමාණ අනුව තේදළු අලෙවි කිරීමට දළු නිෂ්පාදකයාට හැකිවී තිබේ. එමනිසා සාධාරණ මිලක් ලබාගැනීමේ හැකියාව ඇත. හොරණ අරමණාගොල්ල හි පිහිටි තේ ශක්ති පොහොර නිෂ්පාදනාගාරය තුළින් සාධාරණ මිලට තේ ශක්ති පොහොර ලබා ගැනීමේ හැකියාව වැවිලිකරුවන් සතු ය. මාර්ග පද්ධති සංවර්ධන වැඩසටහනක්, ට්‍රැක්ටර් සහ ලොරි රථ 250 ක් බෙදා දීමේ වැඩපිළිවෙළක් සඳහා ද තේ ශක්ති අරමුදල මැදිහත්වී සිටී. මේ සියලු කර්තව්‍යයන් සිදු කෙරෙනුයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පාලනයට යටත්ව ය. මන්දයත්, සාමජික ලියාපදිංචිය සතුවන්නේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට බැවිනි.

නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා දක්වන සහයෝගයට අමතරව, සාමාජීය කටයුතු සඳහා ද තේ ශක්ති අරමුදල ක්‍රියාකාරී වේ. ලෙඩ රෝග, මරණ ආදී අවස්ථා සඳහා මූල්‍යමය අතහිතදීම, සාමජිකයනට විශ්‍රාම වැටුපක් ලබාදීම අවුරුදු හැත්තෑව ඉක්මවූ සාමජිකයන්ටද රක්ෂණ ප්‍රතිලාභ හිමිවීම එකී, විශේෂ කාර්යභාරයන් අතර වේ. කොටස් හිමියන් අතර අරමුදලේ ලාභාංශ විගසින් බෙදාහරිමින් සියලු පහසුකම් සපුරමින්, සාමාජිකයන් හට තවදුරටත් සමීප වී ඔවුන්ගේ දුෂ්කරතා අවම කරමින්, අහිතකර බලපෑම්වලින් සාමාජිකයන් පූර්ණ වශයෙන් මුදවාලීම සමස්ත ලංකා කුඩා තේ වතු මිහියන් ගේ සමිති සම්මේලනයේ එනම් තේ ශක්ති අරමුදලේ අරමුණයි. එම අමරණ මුදුන්පමුණුවා ගැනීම උදෙසා සාමාජිකයන් අතරේ වඩා විශ්වාසනීයත්වයක්, සමීප බවක් ගොඩනැගීමට සාමාජික දූවාදරුවන් සහභාගි කර ගනිමින් දැණුම මිණුම තරග, චිත්‍ර තරග ආදී ප්‍රදර්ශනාත්මක ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමට තේ ශක්ති අරමුදලේ සාමජිකයන්ගෙන් ද සැදුම් ලත් පාලනාධිකාරිය බලාපොරොත්තු වෙයි.

**පෞද්ගලික අංශයේ තේ නිෂ්පාදනය දායකත්වය - 95 - 2005**

| වර්ෂය | පුද්ගලික අංශය | | සමස්ත නිෂ්පාදනය කිලෝ මිලියන | මුළු තේ නිෂ්පාදනයට දායකත්වය % |
|---|---|---|---|---|
| | මුළු තේ නිෂ්පාදනය කිලෝ මිලියන | නිෂ්පාදන වර්ධන ප්‍රතිශතය % | | |
| 1995 | 140.0 | 0.14 | 245.96 | 56.9 |
| 96 | 147.8 | 5.57 | 258.42 | 57.2 |
| 97 | 149.3 | 1.01 | 276.86 | 53.9 |
| 98 | 165.9 | 11.12 | 280.05 | 59.2 |
| 99 | 164.0 | 1.11 | 283.76 | 57.8 |
| 00 | 183.7 | 12.01 | 305.84 | 60.0 |
| 01 | 183.4 | 0.06 | 295.09 | 62.1 |
| 02 | 189.5 | 3.33 | 310.03 | 61.1 |
| 03 | 187.9 | 0.84 | 303.23 | 61.9 |
| 04 | 203.0 | 8.04 | 308.08 | 65.9 |
| 05 | 205.08 | 2.95 | 317.19 | 64.9 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ශ්‍රී ලංකා මුළු තේ නිෂ්පාදනය - 2005 කළමනාකාරිත්ව ආයතන අනුව දායකත්වය**

| කළමනාකාරිත්ව ආයතන | මෙ.ටො. | ප්‍රතිශතය % |
|---|---|---|
| 1. ජනතා වතු සංවර්ධන මණ්ඩලය. රාජ්‍ය වැවිලි සංස්ථාව | 4620 | 1.46 |
| 2. අනෙකුත් | 777 | 0.24 |
| 3. කළමනාකරණ සමාගම් | 105987 | 33.41 |
| 4. කුඩා තේ අංශය | 205811 | 64.88 |
| එකතුව | 317,195 | |

❑

**තොරතුරු ලබාදීම**
**තේ ශක්ති අරමුදලේ සභාපති - ජේ.ඒ.එම්.බී.ජේ. බණ්ඩාර මහතා,**
**පොහොර ව්‍යාපෘති කළමනාකරු - ජී.ඒ.එල්. එදිරිසිංහ මහතා.**

**සටහන - පුබුදු කිත්සිරි**